# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2062/41 - 2018 මාර්තු මස 16 වැනි සිකුරාදා - 2018.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/2/3/10/254.

ගම්පහ අත්තනගල්ල මිනුවන්ගොඩ ඒකාබද්ධ ජලසම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල පවිත්‍රාගාරයට ප්‍රවේශ මාර්ගය වැඩිදියුණු කිරීම හා ජලනල එලීම සඳහා පරවශ්‍යතාව අත්කර ගැනීමට අවශ්‍ය පහත දක්වෙන් ඉඩම/පරවශතාවට ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 365 සී කරස්නාගල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කරස්නාගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද ගම් 4051 දරන පිඹුරේ සඳහන් ඉඩම් කොටස් :

**කැබලි අංක 1**

ඉඩමේ නම: දම්මුලහේන, ගොරකගහලන්ද, ඔයබොඩවත්ත, හල්ගහලන්ද සහ ගොරොක්කොටුවවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 20-30 පමණ වයසැති පොල් ගස් 8ක් ද, කොස් ගස් 7 ක් ද සහිත මිශ්‍ර වගාවක් ඇත; හිමිකම්පාන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (ඇමුණුම බලන්න); ප්‍රමාණය: හෙක්: 0.0312.

**කැබලි අංක 02**

ඉඩමේ නම: දම්මුලහේන, හල්ගහවත්ත, ඔයබොඩවත්ත, හල්ගහලන්ද සහ ගොරොක්කොටුවවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 10 -20 පමණ වයසැති තේක්ක ගස් 06 ක් සහිත මිශ්‍ර වගාවක් ඇත; මුල් හිමිකම් පාන්නා: කේ. ඒ. පද්මලාල් ජයසූරිය, අංක 52, නිකහැටිකන්ද, කරස්නාගල; ප්‍රමාණය: හෙක්: 0.0217.

**කැබලි අංක 03**

ඉඩමේ නම: ඔයබොඩවත්ත, හල්ගහලන්ද සහ ගොරොක්කොටුවවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 10 - 15 පමණ වයසැති පොල් ගස් 2 ක් ද, කොස් ගසක් ද, තේක්ක ගස් 10 ක් ද, මහෝගනී ගසක් ද සහිත මිශ්‍ර වගාවක් ඇත; මුල් හිමිකම් පාන්නා: ඒ. ඒ. ප්‍රභාත් සමන්ත විජේතිලක, අලවල, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්: 0.0294.

**කැබලි අංක 04**

ඉඩමේ නම: ඔයබොඩවත්ත, හල්ගහලන්ද සහ ගොරොක්කොටුවවත්ත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: සුමිත් ජයන්ත හරිස්චන්ද, කරස්නාගල, අලවල, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්: 0.0103.


1A - G 27304 - 32 (2018/03)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**කැබලි අංක 05**

ඉඩමේ නම: ඔයබොඩවත්ත, හල්ගහලන්ද සහ ගොරොක්කොටුවවත්ත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: කේ. ඩබ්. ජගත් ඇන්ටන්, අංක 73/ඒ, නිකහැටිකන්ද, වේයන්ගොඩ; ප්‍රමාණය: හෙක්: 0.0222.

**කැබලි අංක 06**

ඉඩමේ නම: ඔයබොඩවත්ත, හල්ගහලන්ද සහ ගොරොක්කොටුවවත්ත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: පී. අලගියවන්න, අංක 54/ජී, හංසගිරි පාර, ගම්පහ; ප්‍රමාණය: හෙක්: 0.0132.

**කැබලි අංක 07**

ඉඩමේ නම: ඔයබොඩවත්ත, හල්ගහලන්ද සහ ගොරොක්කොටුවවත්ත; විස්තරය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: පී. අලගියවන්න, අංක 54/ජී, හංසගිරි පාර, ගම්පහ; ප්‍රමාණය: හෙක්: 0.0004.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අප්‍රේල් මස 02 වැනි දින පෙ.ව. 10.00 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 මාර්තු මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතු ය.

ඩී. එම්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 පෙබරවාරි මස 28 වන දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

03 -1336

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.